**'හුරාවී' නෞකාව දිවයිනෙන් පිටත් වෙයි**

සුහද සංචාරයක් සඳහා දිවයිනට පැමිණි මාලදිවයින් වෙරළාරක්ෂක බළකායට අයත් 'හුරාවී' නෞකාව අද (ජුලි 09) දින දිවයිනෙන් පිටත් විය. එහිදී, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික සම්ප්‍රදායානුකූලව එම නෞකාව වෙත සමුදීම කොළඹ වාරයේදී සිදු කරන ලදී.

මෙම නෞකාව තුන්දින සුහද සංචාරයක් සඳහා පසුගිය සෙනසුරාදා (ජුලි 07) දින දිවයිනට සේන්දු විය.